**ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය - 2019**

**-----------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය , සමුච්චිත අරමුදල වෙනස්වීමේ ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 වගන්තියට අනුව, වත්කමක සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් තවදුරටත් භාවිතයේ ඇති සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති පිරිවැය රු. 1,270,025,416 ක් වූ දේපල පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | අප විසින් දේපල පිරියත සහ උපකරණ තක්සේරු කිරීමක් සිදු කරමින් සිටින අතර, තක්සේරුව සිදු කර කළමනාකරණය විසින් පිළිගත් පසු ගිණුම් පොත්වලට අවශ්‍ය සටහන් ඇතුළත් කරනු ලැබේ. | අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදී වත්කම්වල සුන්බුන් වටිනාකම සහ ඵලදායි ජීව කාලය සමාලෝචනය කළ යුතුවීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දකුණු අප්‍රිකානු සංචාරයට අදාළව අනුග්‍රාහක අයිතියෙන් ලැබිය යුතු අවිනිශ්චිත ආදායම රු.33,955,882 (ඇමරිකානු ඩොලර් 187,085) ක් වූ අතර එය එම අනුග්‍රාහක සමාගමෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, | සටහන් කර ගන්නා ලදි. | අවශ්‍ය අනාවරණය කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කිරීමට කඩිනම් පියවර ගත යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) විසින් විමර්ශනයක් සිදු කරමින් පවතී. | | |
| **(ආ)** | රු.5,845,788 ක් වූ හඳුනා නොගත් ශේෂයක් 2013 වර්ෂයේ සිට පොදු අත්තිකාරම් - ගිණුමට ඇතුළත් කර තිබුණි. එම ශේෂයන් හඳුනාගෙන ගැලපීම් සිදු නොකර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ ඉදිරියට ගෙන ගොස් තිබුණි. | වටිනාකම රු.5,845,788 ක් වූ අත්තිකාරම්- 2011 වර්ෂයට පෙර ඉදිරිපත් කරන ලද ශේෂයන් වන අතර ආපසු අයකර ගත නොහැකි අගයන් කපා හැරීම සඳහා සාමාජික අනුමැතිය ලබා ගැනීම සඳහා විධායක කමිටුව විසින් ඊළඟ මහා සභා රැස්වීමේදී සභාගත ගත කිරීමට නිර්දේශ කර ඇත. | ශේෂයන් හඳුනා ගැනීම සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය වෙනස්කම් කිරීමට කඩිනම් පියවර ගත යුතුවීම. |
| **(ඇ)** | ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පත් කරන ලද අතුරු කමිටුවේ කාල සීමාව තුළ අදාළ බලධාරීන්ගේ අනුමැතිය නොලැබුණු රු.26,068,579 ක් අගය වූ ව්‍යාපෘති හතරක් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් අතහැර දමා ඇති අතර ව්‍යාපෘතිවල වටිනාකම ගැලපීම් කිරීමකින් තොරව තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. | එම ව්‍යාපෘති ඉදිකිරීමට අතුරු කමිටුව විසින් තීරණය කරන ලද නමුත් ඔවුන්ගේ සේවා කාලය තුළ එය සම්පූර්ණ කළ නොහැකි විය. පසුව තේරී පත් වූ කමිටුව, අතුරු කමිටුව විසින් ආරම්භ කරන ලද ව්‍යාපෘතිය තක්සේරු කරන ලද අතර, අදාළ බලධාරීන්ගෙන් කිසිදු අනුමැතියක් නොලැබීම සහ අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා තෙක් ව්‍යාපෘති අතහැර දැමීමට සිදුවිය. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කඩිනම් පියවර ගත යුතුවීම. |
| **(ඈ)** | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගණනය කරන ලද රඳවා ගැනීමේ බදු හා ආර්ථික සේවා ගාස්තු බදු සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූප වත්කම් අතර රු. 46,573,373 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එකතු කළ අගය මත බදු ප්‍රතිලාභයේ රුපියල් 111,543,451 ක් වූ වගකීම් පිරිවැටුම, ප්‍රකාශයට පත් නොකිරීම හේතුවෙන්, එකතු කළ අගය මත බදු (වැට්) වගකීම රු .8,931,206 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මෙය බදු උපදේශකයින් සමඟ නිවැරදි කළ යුතු අතර 2020 වර්ෂයේ දී අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබේ. | ශේෂයන් සැසඳීමට සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය වෙනස්කම් කිරීමට කඩිනම් පියවර ගත යුතුවීම. |

**1.5.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව | උපලේඛන වාර්තා අනුව | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු . | රු . | රු . | | |
| රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවිය යුතු | 258,347,662 | 147,362,669 | 110,984,993 | සටහන් කර ගන්නා ලදි. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සැසදීමට කඩිනම් පියවර ගත යුතුවීම. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| | විෂයය | වටිනාකම | ලිඛිත සාක්ෂි නොමැතිවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු . | | | |
| (අ) | ලැබිය යුතු ශේෂයන් 03 | 68,038,113 | ශේෂ සනාථන | සටහන් කර ගන්නා ලදි . | ලැබිය යුතු ශේෂ තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් කළ යුතුවීම. |
| (ආ) | අත්තිකාරම් සහ තැන්පතු 07 | 143,404,077 | ශේෂ සනාථන | සටහන් කර ගන්නා ලදි . | අත්තිකාරම් සහ තැන්පතු ශේෂ තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් කළ යුතුවීම. |
| (ඇ) | ගෙවිය යුතු ශේෂයන් | 105,880,318 | ශේෂ සනාථන | සටහන් කර ගන්නා ලදි . | ගෙවිය යුතු ශේෂ තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් කළ යුතුවීම. |
| (ඈ) | උපචිත වියදම් | 18,857,016 | විස්තරාත්මක උපලේඛන | සටහන් කර ගන්නා ලදි . | ශේෂයන් තහවුරු කිරීම සඳහා සවිස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.471,133,388 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,259,301,564 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු .2,730,434,952 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආදායම රු 2,978,116,352 කින් අඩුවීම එම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහනුවර කටුගස්තොට පර්චස් 256 කින් යුත් වලකුඹුර වත්ත නම් ඉඩමක් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් 2017 අප්‍රේල් 29 වන දින වසර 30 ක කල්බදු පදනම යටතේ ක්‍රිකට් විශ්ව විද්‍යාලයක් පිහිටුවීම සඳහා බදු ගෙන ඇති අතර, වසර 30 ක් සඳහා ගෙවිය යුතු බදු කුලිය රු. මිලියන 26.25 ක් විය. මීට අමතරව, බදුකරුට ඉඩම සඳහා පරිත්‍යාගයක් ලෙස රු. මිලියන 25 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ක්‍රිකට් විශ්ව විද්‍යාලයක් ඉදිකිරීමේ ආරම්භක හා නිමකිරීම් දිනයන් පිළිබඳව තොරතුරු නොවුණි. | ගොඩනැගිලි අයදුම්පත් නාගරික සංවර්ධන අධිකාරියට (UDA) ඉදිරිපත් කර ඇති අතර අනුමැතිය ලැබීමෙන් පසු ගොඩනැගිලි ඉදිකිරීම් ආරම්භ කළ හැකිය. | ක්‍රිකට් සරසවියේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුවීම. |
| (ආ) | 2018 ඔක්තෝබර් 17 දින වන විට ක්‍රිකට් ක්‍රීඩාංගණයේ ඉදිකිරීම නිම කිරීමේ අපේක්ෂාවෙන් 2017 අගෝස්තු 17 වන දින ප්‍රදානය කරන ලද ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනය සහ බහු ක්‍රීඩා සංකීර්ණය ජාත්‍යන්තර මට්ටමින් පොලොන්නරුවේ සහ හිගුරක්ගොඩ සංවර්ධනය වෙමින් පවතින අතර 2019 දෙසැම්බර් 31 දින වන විට රු.132,088,862 ක් වැයකර තිබුණි. කෙසේ වුවද, ක්‍රිකට් ක්‍රීඩාංගනය සහ ක්‍රීඩාගාරය ඉදිකිරීමට අදාළ සැලසුම් සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතු ආයතන දෙකෙහි නිර්දේශ සහ අක්කර 10 ක ඉඩම සඳහා හිමිකම් ඔප්පුවක් ලබාගෙන නොතිබුණි. තවද, ක්‍රීඩාංගණයේ වාරිමාර්ග පද්ධතියට අදාළ නල, ජලාපවහන පද්ධතියකට සම්බන්ධ කර නොතිබූ අතර ක්‍රීඩාංගණයේ පිවිසුම් මාර්ග සහ ආරක්ෂිත වැටවල් ස්ථාපිත කර නොතිබුණි. අදාළ ඉඩම සඳහා | මෙම කොන්ත්‍රාත්තුව 2017/08/17 දින ප්‍රදානය කර ඇතත්, ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා ඉඩම 2018/05/31 දින භාර දී ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රමාදය විධායක කමිටුව විසින් දැනුම් දී ඇති අතර නැවත ආරම්භ කිරීම සහ වැඩ කටයුතු 2019/02/22 දින සිදු කර ඇත. ව්‍යාපෘති කොන්ත්‍රාත් අංක 1 සියයට සියයක් සම්පූර්ණ කර ඇති අතර අංක 4 කොන්ත්‍රාත්තුව 75% ක් පමණ සම්පූර්ණ කර ඇති අතර සම්පූර්ණ ව්‍යාපෘතියම 2020/08/31 දින වන විට අවසන් කිරීමට නියමිතය. | ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනය සහ බහුකාර්ය ක්‍රීඩා සංකීර්ණයේ ඉදිකිරීම් අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතුවීම. |

හිමිකාරිත්වයක් නොතිබූ බැවින් විදුලිය ලබා දී නොතිබුණි. අවසාන වශයෙන්, කොන්ත්‍රාත් වැඩ ආරම්භ කිරීමේ සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂය වන විට ද ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2006 හි 4.2 වගන්තියට අනුව, 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ප්‍රසම්පාදන සැලැස්ම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික අයවැයට අනුකූල වන පරිදි ප්‍රසම්පාදනය සඳහා පුළුල් සැලැස්මක් අප සතුව ඇති අතර සංචාර සහ තරඟාවලි නැවත සකස් කිරීම හේතුවෙන් එය අඛණ්ඩව වෙනස් වේ. තත්‍ය අවශ්‍යතාවය මත පදනම්ව ප්‍රසම්පාදනය සිදු කෙරේ. | ප්‍රසම්පාදන සැලැස්ම විගණනය වෙත ඉදිරිපත් කළ යුතුවීම. |
| (ආ) | ටොන් 01 සිංගල් ඩ්‍රම්ස් යාන්ත්‍රික රෝලර් 25 ක් රු.36,360,500 ක පිරිවැයකට මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදනයට පෙර ප්‍රතිලාභීන් හඳුනාගෙන නොතිබුණි. පෙර වර්ෂ 3 තුළ කිසිදු ප්‍රධාන ආදායමක් වාර්තා කර නොතිබුණු ඉංජිනේරු උපදේශන සේවා ආයතනයක් මගින් ප්‍රසම්පාදනය සිදුකර තිබුණු අතර එහි මූල්‍ය හැකියාව හා සැපයුම් හැකියාව අගය කිරීමක් සිදුකර නොතිබුණි. මෙම යන්ත්‍ර ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ලබා දී ඇති පිරිවිතරයන් තහවුරු කිරීමෙන් පසුව නිසි ලෙස පවරා ගෙන නොතිබුණි. | ක්‍රිකට් උපකරණ හා යන්ත්‍රෝපකරණ සැපයීමේදී ලියාපදිංචි සැපයුම්කරුවන් 5 දෙනෙකුගෙන් අප විසින් මිල කැඳවීම් කර ඇති අතර සැපයුම්කරුවන් 5 දෙනෙකුගෙන් 4 දෙනෙකු ප්‍රතිචාර දක්වා ඇත. තාක්ෂණික ඇගයීම් වාර්තාව මත පදනම්ව අවශ්‍ය පිරිවිතරයන්ට අනුකූලව අඩුම ලංසුකරුට ටෙන්ඩරය ප්‍රදානය කර ඇත. මෙය ටෙන්ඩර් මණ්ඩලය, කළමනාකරණ කමිටුව සහ විධායක කමිටුව විසින් අනුමත කර ඇත. | නිවැරදි ආකාරයෙන් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතුවීම. |